

දුටුගැමුණු රජතුමා කරවූ රුවන්මැලි මහා සෑය

## ⁘ බුදුසමය විග්‍රහ කරන නිදහස් චින්තනය

– ආචාර්ය සිරිපාල මාදුවගේ
සත්‍ය ගවේෂණය සඳහා පුද්ගලයා තුළ තිබිය යුතු චින්තන රටාවේ ස්වභාවය. ලෝක සත්‍යය අවබෝධ කිරීම සඳහා බුදුරදුන් තම ශ්‍රාව–කයාට ලබා දී ඇති අපූර්ව චින්තන නිදහස.

## ⁘ අධර්මය ධර්මයෙන් දුරු කිරීමේ බෞද්ධ ප්‍රතිපත්තිය

– රෙජී වීරමන්
අධර්මයට – දුසිරිතට පෙළැඹුණු පුද්ගලයන් සුසිරිතට – යහමඟට ගැනීම සඳහා බුදු වදනෙන් අනුමත වූ නිවැරැදි ප්‍රතිපදාව නිරවුල් කර ගැනීමට දරන ප්‍රයත්නයකි.

## ⁘ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නා හිමි
බුදු දහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්න සහ පිළිතුරු මඟින් පාඨකයා දැනුවත් කරන විශේෂාංගයකි. දහම හදාරන සිසුන්ට මෙම විශේෂාංගය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකියි.

## ⁘ දෙලොව දියුණුවට බුදු හිමි වදාළ දහම

– හේමමාලා රත්දුනු
පුද්ගලයාගේ දෙලොව අභිවෘද්ධියට හේතු වන බුදුරදුන් දෙසූ ඉතා වැදගත් ජීවන පිළිවෙත් සතරක් පිළිබඳ විමර්ශනයකි, මෙම ලිපිය.

## ⁘ සාමයික සහජීවනය සහ බුදු දහම

–ආචාර්ය අලුත්වැව සෝරත නා හිමි
විකල්ප ආගමික සංකල්ප හා දර්ශනවාද පිළිබඳ බොදුනුවා තුළ පැවතිය යුතු සහනශීලී බව. දෘෂ්ටියක් නොවන – පර්යේෂණ මඟක් වූ බොදු පිළිවෙත තුළ දර්ශනික වශයෙන් දක්නට ලැබෙන විවෘත බව.

## ⁘ චතු සච්ච පබ්බ (පරිග්ගහ) භාවනාව

– මහාචාර්ය උතුරාවල ධම්මරතන හිමි
'සතිපට්ඨාන' නමින් ප්‍රකට බෞද්ධ විදර්ශනා භාවනා ක්‍රමය පැහැදිලි කරන ලිපි පෙළක තවත් කොටසක්. ආර්ය සත්‍ය සතර පිළිබඳ විශේෂ දැකීමක් ඇතිකර ගන්නා අයුරු දැක්වෙන විදර්ශනා කොට–සක් පිළිබඳ විමර්ශනයකි; මෙම ලිපියෙහි ඇතුළත් වන්නේ.

## ⁘ සිත් සතන් දවන කෙලෙස් ගිනි සතුරන් ඇති කරන මඟකි

– ආනමඩුවේ ධම්මරතන හිමි
මිනිස් සිතෙහි ඇති වන 'කෙලෙස්' හෙවත් සෘණ ආවේග දහසයක් පිළිබඳ බුද්ධ දේශනාවකට අර්ථකථනයකි. පුද්ගලයාගේ දෙලොව පරිහානියට හේතු වන – විමුක්ති මඟෙන් ඔහු බැහැර කරන අකුසල ස්වභාව දහසයකි, එම සූත්‍ර දේශනාවෙන් පෙන්වා දී ඇත්තේ.

## ⁘ නැණ – ගුණ පිරි උතුමන් ඇසුර දුබලයකුට වුවද දෙලොව වැඩ සදයි.

– දිවියාගහ යසස්සි නා හිමි
පුද්ගලයන් තුළ පවතින බුද්ධි මට්ටමේ විවිධත්වය අනුව – අව–බෝධය ලද අය ඇසුරෙන් ඔවුන් දහම වටහා ගන්නා අයුරු පැහැදිලි කළ දේශනාවකට අර්ථ කථනයකි; නැණ – ගුණ පිරි උතුමන්ගේ ඇසුර ලැබීමේ අනුසස් පෙන්වා දෙන ලිපියකි.

## ⁘ ඓතිහාසික හකුරුගල විහාරය

– දුමින්ද කාරියවසම්
අවිස්සාවේල්ල සිට කෑගල්ල බලා දිවෙන මාර්ගයේ රුවන්වැල්ල නගරයට මදක් ඔබ්බෙන් ඇති ගුරුපැන්න ග්‍රාමයේ පිහිටා ඇති ඉපැ–රැණි ඓතිහාසික විහාරස්ථානයක් ගැන තොරතුරු; මෙවර 'වෙහෙර විහාර' විශේෂාංගයෙන්.

## ⌘ දින දින සැබෑ වන කොසොල් රජු දුටු සිහින

– ඒ.ඒ. නිර්මලා අමරසිංහ

බුදු සසුනෙහි සහ ලෝක සමාජයෙහි අනාගතයේදී සිදුවන වෙනස්–කම් පිළිබඳ පෙර නිමිති වශයෙන් කොසොල් රජු එදා දුටු බව පැව–සෙන සිහින දහසයකින් නිරූපණය වූ යථාර්ථ පිළිබඳ බුදුරදුන් දුන් අර්ථ විවරණයි, මෙම ලිපියෙන් විස්තර කැරෙන්නේ.

## ⌘ මත් උවදුර මඬින්න රජයකට කළ හැකි දෙයක් නැද්ද?

– කතුවැකිය

## ⌘ පිරුවානා පොත් වහන්සේගේ අන්තර්ගතය පිළිබඳ විමැසුමක්

– එච්. ජී. පියසේන

තෙරුවන් ගුණ බලයෙහි ආශීර්වාදයෙන් තමන්ගේ ජීවිතවලට කිසි–යම් ශාන්තියක් ලබාගත හැකි වෙතැ'යි බෞද්ධයන් විශ්වාස කළ; ඒ සඳහා එදා සිටම භාවිතා කළ 'පිරුවානා පොත් වහන්සේ' නමින් ප්‍රකට පිරිත් පොතෙහි ඇතුළත් සූත්‍ර දේශනා සහ එම සූත්‍ර දේශනාවලට නිදන් වූ ශාසනික සිදුවීම් පිළිබඳ විමර්ශනයකි. මෙම ලිපියේ කොටස් කිහිපයක් පසුගිය පත්‍ර වල ද පළ විය.

## ⌘ Five aggregates

*-by Ven. Wellawatte Gnanabhiwansa Nayake Thera*